දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
Inland Revenue Department

# බදු ගෙවන්නන් වෙත කරනු ලබන නිවේදනයයි

## බදු වාසිකත්ව සහතිකය (TRC) ලබා ගන්නා ආකාරය

බදු වාසිකත්ව සහතිකයක් (TRC) සඳහා අයදුම් කිරීමේ දී අනුගමනය කළ යුතු විධිමත් පියවර පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සියලුම බදු ගෙවන්නන් (පුද්ගලයින්, සමාගම් සහ හවුල් ව්‍යාපාර) වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් (Double Taxation Avoidance Agreements – DTAA) යටතේ හිමිවන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙම සහතිකය අත්‍යවශ්‍ය වේ.

### 1.බදු වාසිකත්ව සහතිකයක් අයදුම් කිරීමට හේතු

ඔබ විදේශ රටකින් /අධිකරණ බල ප්‍රදේශයකින් ආදායමක් උපයන්නේ නම්, එම රට තුළ ඔබට බදු ගෙවීමට සිදුවිය හැකි ය. කෙසේ වුවද, ශ්‍රී ලංකාව සහ එම විදේශ රට /අධිකරණ බල ප්‍රදේශය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමක් (DTAA) පවතින්නේ නම්, ඔබට බදු ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකම් පෑම් ඉදිරිපත් කළ හැකි ය. එසේ බදු ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඔබ ශ්‍රී ලංකාවේ බදු වාසිකයෙකු (Tax Resident) බවට සාක්ෂියක් වශයෙන් බදු වාසිකත්ව සහතිකයක් (TRC) විදේශීය බදු අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔබට ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් ලැයිස්තුව වෙත පහත සඳහන් සබැඳිය ඔස්සේ පිවිසිය හැකි ය.
https://www.ird.gov.lk/en/publications/sitepages/International%20Relations.aspx?menuid=1401

### 2.බදු වාසිකත්ව සහතිකයක් ලබා ගැනීමට අයදුම් කළ හැකි අය

ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් යටතේ බදු ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා හෝ වෙනත් රටවල බදු සම්බන්ධ අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවෙන් බදු වාසිකත්ව සහතිකයක් (TRC) ලබා ගැනීමට අවශ්‍ය වන ඕනෑම වාසික බදු ගෙවන්නෙකුට මේ සඳහා අයදුම් කළ හැකි ය.




### 3.බදු වාසිකත්ව සහතිකයක් ලබා ගැනීමට අයදුම් කිරීම

බදු වාසිකත්ව සහතිකයක් (TRC) ලබා ගැනීම සඳහා අයදුම්පත, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති නියමිත ආකෘති පත්‍රය භාවිතයෙන් ඉදිරිපත් කළ යුතු ය. අදාළ අයදුම්පතේ ආකෘති පත්‍රය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන
https://www.ird.gov.lk/en/Downloads/SitePages/Forms.aspx?menuid=1603
වෙතින් ලබා ගත හැකි ය.
එම අයදුම්පත මගින් සපයනු ලබන සියලුම තොරතුරු සම්පූර්ණයෙන් හා නිවැරදිව ලබා දීමටත්, අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ ලිපිලේඛන මගින් ඒවා තහවුරු කිරීමටත් අයදුම්කරු විසින් වගබලා ගත යුතු ය.

### 4.අයදුම්පත ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ අවශ්‍ය තහවුරු කිරීමේ ලිපිලේඛන ඉලෙක්ට්‍රොනිකව පහත සඳහන් අංශය වෙත භාර දිය යුතු ය:

- **ජාත්‍යන්තර බදු කටයුතු අංශය**
- **විද්‍යුත් තැපෑල: itp@ird.gov.lk**

අයදුම්කරුගේ බදු වාසිකත්ව තත්ත්වය තීරණය කිරීම සඳහා අතිරේක තොරතුරු හෝ ලිපිලේඛන අවශ්‍ය යැයි සලකන අවස්ථාවකදී, දෙපාර්තමේන්තුව විසින් එම තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

### 5.අවශ්‍ය තොරතුරු සහ ලිපිලේඛන

- අයදුම්පත්‍රය
- පෙර ලේඛන: මීට පෙර නිකුත් කර ඇති බදු වාසිකත්ව සහතිකයක (TRC) ස්කෑන් කළ පිටපතක් (අදාළ නම්)
- විදේශ බදු අධිකාරියෙන් / ගෙවීම්කරුගෙන් ලද ඉල්ලීම: (අදාළ නම්)
- සංස්ථාගත කිරීමේ හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
- අයදුම්කරු වෙනුවෙන් නියෝජිතයෙකු විසින් මුල් බදු වාසිකත්ව සහතිකය (TRC) ලබා ගන්නේ නම්, බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**තනි පුද්ගල අයදුම්කරුවන් සඳහා (අතිරේක අවශ්‍යතා)**:

- ජාතික හැඳුනුම්පතේ ස්කෑන් කළ පිටපතක්
- විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත ඇතුළත් පිටුවේ, සියලුම වීසා පිටුවල සහ ශ්‍රී ලංකාවට පැමිණීමේ/ශ්‍රී ලංකාවෙන් පිටවීමේ මුද්‍රා සහිත සියලුම පිටුවල ස්කෑන් කළ පිටපත්. (සටහන: ගොනුවේ ප්‍රමාණය 10MB ඉක්මවන්නේ නම්, එය විද්‍යුත් තැපැල් පණිවිඩ දෙකක් ලෙසට වෙන් කරන්න.)
- අයදුම්පත ඉදිරිපත් කළ හැකි වාර ගණන සහ නියමිත දිනය

  අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත අවසන් දිනයක් නොමැත. බදු ගෙවන්නාගේ අවශ්‍යතාවය අනුව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ හැකි ය. එහෙත්, බදු වාසිකත්ව සහතිකය (TRC) වලංගු වන්නේ නිකුත් කළ දින සිට මාස 12ක කාලයක් සඳහා පමණි.

### 6. අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර සපුරාලිය යුතු අවශ්‍යතා

අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර, බදු ගෙවන්නන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) තුළ පවත්වාගෙන යනු ලබන තොරතුරු යාවත්කාලීනව සහ නිවැරදිව තිබෙන බවට තහවුරු කර ගත යුතු ය.

විශේෂයෙන් ම, බදු ගෙවන්නන් විසින් පහත සඳහන් කරුණු තහවුරු කර ගත යුතු ය:

1. වර්තමාන පදිංචි ලිපිනය හෝ ලියාපදිංචි ලිපිනය යාවත්කාලීන කර තිබීම;
2. අදාළ අවස්ථාවලදී, ව්‍යාපාරික කටයුතුවල ස්වභාවය නිවැරදිව සටහන් කර තිබීම;
3. බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සහ බදු ගෙවන්නාගේ පැතිකඩ තොරතුරු නිවැරදිව සටහන් කර තිබීම; සහ
4. අදාළ සියලුම බදු වාර්තා, ප්‍රකාශන භාර දීම සහ ගෙවීම් නියමිත පරිදි සිදු කර තිබීම.